# ජනතාවට ඇති වන පීඩාව සහ ජ.වි.පෙ. මතවාද

ජනතා විමුක්ති පෙරමුණේ නායක සෝමවංශ කියන්නේත් අපි කියන විදියටම ඉංදියාවේ උවමනාවට පිල්ලෙයාන් බලයට ගෙනාව කියලයි.

මේ ආණ්ඩුව ගෙනියන්නේ ඇමරිකන් ඉංදියන් ඒජන්ත කම බව කියන කොට මේ උන්නැහේලා කිව්වේ ජාතික විමුක්ති වැඩපිළිවෙලක් සඳහා තමන් මහින්ද බලයට ගෙනාවා කියලයි

"ආණ්ඩුව තමන්ගේ න්‍යාය පත්‍රයට අමතරව බටහිර සහ ඉංදීය බලපෑම් අනුවයි ඔය මැතිවරණයට යන්නේ. ආණ්ඩුවේ වැඩකටයුතු සියල්ල නාභිගත නන්නේ තමන්ගේ පැවැත්ම කොහොමද කියලා බලාගන්න."

මෙහෙම කියන මුන්දලා එදා කළේ දේශීය රාජ්‍යයක් ගොඩනැගීම වෙනුවෙන් කියමින් මහින්දගේ පරගැති ධනපති රාජ්‍යය තහවුරු කිරීමයි

**එදා සෝමවංශ කළේ දේශීය රාජ්‍යයක් ගොඩනැගීම වෙනුවෙන් කියමින් මහින්දගේ පරගැති ධනපති රාජ්‍යය තහවුරු කිරීමයි.**

**ආණ්ඩුව එහෙම ශක්තිමත් කරන්නට විමල් වගේ අය එතැනට දැක්කුවේ සෝමවංශමයි"**

**අපි ඒ වෙලාවෙදිත් මෙය පරගැති බලයක් බව පෙන්වල දෙද්දි ඔවුන් අපට පහර ගැහුවේ අපි රට පාවා දීම සඳහා එවැනි මඩ ප්‍රහාර තමන්ට එල්ල කරන බවයි.**

ආණ්ඩුව එහෙම ශක්තිමත් කරන්නට විමල් වගේ අය එතැනට දැක්කුවේ සෝමවංශමයි

අපි ඒ වෙලාවෙදිත් මෙය පරගැති බලයක් බව පෙන්වල දෙද්දි ඔවුන් අපට පහර ගැහුවේ අපි රට පාවා දීම සඳහා එවැනි මඩ ප්‍රහාර තමන්ට එල්ල කරන බවයි. දැන් එකපාරටම යැංකි, මංකි බලවේගවලින් මෙහෙයවන ආණ්ඩුවක් හැටියට පෙනෙන්නට පටන් අරන්. ඒත් මේ විදියට එක පැත්තක් දැක්කත් අනෙක් පැත්ත දකින්න බැරි වෙලා තියෙනව. සෝමේ මෙහෙමත් කියනව.

> "ඊංදියාව දෙමළ ජනතාවගේ විමුක්ති දායකයා හැටියටයි පෙනී සිටින්නේ."

අරුම පුදුමයකට වගේ දෙමළ ජනතාවට විමුක්තියේ ප්‍රශ්න තිබෙන බව මේ උන්දලා පිළිගන්නවද? ඉංදියාව මේ විදියට රිංග ගණ්නේ දෙමළ ජනතාවට විමුක්තිය ගැන ප්‍රශ්නයක් තිබෙන නිසා බව "අපි මුල ඉඳළම පෙන්වලා දුන්න. ඉංදීය බලවතුන් පමණක් නොව බටහිර බලවතුන් වුණත් මේ රටට රිංගන්නේ දෙමළ විමුක්ති සටනට උපකාර වන බව පිළිගෙනයි.

මේ ජාතිවාදී පකිස් බූරුවන්ට නොතේරෙන ප්‍රශ්නය නම් අපේ රටේ දෙමළ ජනතාවට තම ජාතික නිදහස ගැන තිබෙන කැක්කුම ගැන දකුණේ රැඩිකල් බලවේග අමතක කරන්නේ කොයි තරමටද, ඒ පමණටම පිටස්තර මංකොල්ලකාරයින් දෙමළ විමුක්තිය ගැන කිඹුල් කඳුළු හෙළමින් දෙමළගේ කරපිටින් මේ රටේ සම්පත් මංකොල්ලයට ගොඩබසිනව කියන එකයි.

දැන් මේ වෙලා තියෙන්නේ ඒ දෙයයි. ඉංදියාව මේ රටට කඩා පැනීමට පමණක් නොව යැංකි බලය අත පෙවීමටත් පාර කපා දුන්නේ සෝමෙගේ ඇම්බැට්ටයෝම පහු ගිය කාලේ නටාපු දේශප්‍රේමී, දේශහිතෛෂී නාඩගමයි.

දෙමළ ජනතාවගේ නැගිටීමේ කොන්ද කඩා දැමීම සඳහා මහින්ද රජය යැංකි, මංකි බලවේගවල උදව්වෙන් ගෙන ගිය මර්ධනකාරී මිලිටරි සැලැස්මට තවමත් ලැජ්ජා නැතිව සෝමේ උඩගෙඩි දෙන එකයි සංගෙ නැති වැඩේ.

උන්දැ මෙහෙමත් කියනව.

> "හමුදාව සටන් කළේ කුමක් සඳහාද? ජාතිවාදය පැරදවීමට, ඒ ප්‍රදේශවල ජනතාවට සහන ලබාදීමට, ජාතිවාදය අහෝසි කිරීම සඳහා ලැබුණ සියළුම පරිත්‍යාග, හමුදාව සහ රටේ ජනතාව කළ පරිත්‍යාගයි. පරිත්‍යාග නොකළ එකම කණ්ඩායම ආණ්ඩුවයි."

මේ මනුස්සයා මාක්ස්වාදියෙක් කියන අතරම ධනපති රාජ්‍යයේ මර්ධනයට සහයෝගය දෙනව. එදා 71 හා 89 දීත් හමුදාව ක්‍රියා කළේ ජනතාවට සහන ලබාදීමට හා ජාතිවාදය පැරදවීමටද?

ජනතා විමුක්ති පෙරමුණේ 10,000 ක් පමණ 71 දීත්, 40,000 කට වැඩි ගණනක් 89 දිත් මරා දමනු ලැබුවා. ඒ හමුදාව මගින්. එදත් සරත් ෆොන්සේකලා, ගෝඨාභය රාජපක්ෂලාත් හිටියා.

එදා කළේ මහා නිර්ධන පංති මර්ධනයක් කියලයි ජනතා විමුක්ති පෙරමුණ කිව්වේ. නැත්නම් දේශප්‍රේමී ජනතාව මරා දැමීමක් කියලත් කිව්වා. ධනපති හමුදාව කැරලිකරුවන් මරා දමන්නේ ධනපති පංතිය වෙනුවෙන් පාලනය තහවුරු කරන්නට මිස වෙන කිසිවකට නෙවෙයි. මෙය අපි එදත් කිව්වා. අදත් කියනව.

මේ රජය දෙමළ කැරලිකරුවන් මරා දමන්නෙත්, එදා සිංහල කැරලිකරුවන් මරා දැමුවේත් ධනපති පාලනය වෙනුවෙන් මිස ජනතාවට සහන දීමට නෙවෙයි. විමල් වීරවංශලා පක්ෂයෙන් ඉවත් කළත් මුන්නැහේලා තවමත් ඉන්නේ ධනපති රාජ්‍ය බලයට පුද පූජා තවත්වන තැනක බවයි ඉතාම පැහැදිලිව පේන්නේ.

**ලාල් කාන්ත මහත්තයා ලොකු ගෝරනාඩු දමන්නේ වැඩ කරන ජනතාවට මහින්දගේ ආණ්ඩුවෙන් වෙන අසාධාරණ ගැනයි.**

**ඒත් එයාගේ නායකතුමා කියන්නේ දෙමළ කැරැල්ල මැඩපැවැත්වීම හරියට නොකරන නිසා තමන් රජයට විරුද්ධ බවයි.**

**දැන් ලාල් කාන්ත උන්නැහේ මේ උතුර බේරා ගැනීම වෙනුවෙන් කරන යාඥා නොතකා මහ වැඩවර්ජන කිරීමෙන් සිදුවෙන්නේ ධනපති රජය සහ ගැටුමට යාමයි. එවිට ධනපති හමුදාව ලාල්ගේ ඇටකටු කඩා හිර ගෙවල්වල දාන්න ඉඩ තියෙනව. මෙතැනදී ජනතා විමුක්ති පෙරමුණ ගන්නේ කාගේ පැත්තද?**

**වැඩවර්ජනයට බැට දෙන්න එන රාජ්‍ය හමුදාවේ පැත්තද, නැත්නම් බැට කන කම්කරුවන්ගේ පැත්තද?**

මේ ඊනියා දේශප්‍රේමී යුද්ධයෙන් දෙමළ කැරලි මැඩපවත්වා ඒ පෙදෙස්වල සම්පත් ඉංදියාව ඇතුළු ගෝලීය බලවත්තුනට විකුණාගෙන කෑම සඳහා ආණ්ඩුව ක්‍රියා කරන එක අළුත් දෙයක් නෙවෙයි.

ඒක තමා එහි න්‍යාය පත්‍රය. ඒ උඩයි යැංකි, මංකි උදව් ආණ්ඩුවට ලැබුණේ.

සෝමේ හිතන් ඉඳලා තියෙන්නේ මහින්දත්, හමුදාවත් ජනතාවට සහන සැලසීමට යුද්ධය ගෙනියනව කියලයි. මාක්ස්ගේ ලෙනින්ගේ මොන පොත්වලද ඔය විදියට ධනපති පාලකයින් ධනපති හමුදාවක් ක්‍රියා කරනව කියල කියල තියෙන්නේ.

මේ විකාර මාක්ස්වාදීන් තවම දන්නේ නැහැ තමන් රතු පාට ඉඳ හිට අඳින සිංහල සුළු ධනේශ්වර නරෝඩ්නික්වරුන් බව. ඒ බව ඒ අයට තේරෙන්න විදියක් නැනේ.

සෝමවංශ මෙහෙමත් කියනවා

> "කරගෙන ගිය ප්‍රජාතන්ත්‍රවාදය ස්ථාපිත කිරීමේ ක්‍රියාමාර්ගය සහ ජනතාවට අහිමි කර තිබෙන ආර්ථික, දේශපාලන, සංස්කෘතික ජීවිතය ඒ ජනතාවට ලබාදීමයි ආණ්ඩුව කළ යුතුව තිබුණේ."

මේ කියන්නේ මේ මර්ධනකාරී ධනපති රජය දෙමළ පෙදෙස්වල ගෙන ගිය ක්‍රියාමාර්ගය "ආර්ථික දේශපාලන හා සංස්කෘතික ජීවිතය ඒ ජනතාවට ලබාදීම" හැටියට ජනතා විමුක්ති පෙරමුණ දකින බවයි.

ඇත්තටම මහින්ද පමණක් නොව සියළු ධනපති නායකයෝ 1971 සිටම කියන්නේ තරුණ කැරලිකරුවන් ප්‍රජාතන්ත්‍රවාදය හා සංස්කෘතිය විනාශ කරන බවයි. එදා 1971 දී මෙන්ම 88/89 දීත් ජන ජීවිතයත්, ප්‍රජාතන්ත්‍රවාදයත් ආරක්ෂා කිරීම හැටියට තරුණයන් මරා, තලා හමුදාව ලොකු පිනක් කළ බව තමා ධනපති පාලකයින් කියන්නේ.

මෙතැනදී ජේ.ආර්., ප්‍රේමදාස, සිරිමාවෝ, චන්ද්‍රිකා, මහින්ද, රනිල් ආදී සියළු ධනපති පාලකයෝ එක බඩවැල කඩාගෙන ආ සොහොයුරන් මෙන් අත්වැල් බැඳගෙන එක හඬම තලනවා. දන් බැළුවහම ජනතා විමුක්ති පෙරමුණත් ඒ හඬම නැගීමට එක්වන බවයි පෙනෙන්නේ.

මොන තරම් විහිළුවක්ද? ලාල් කාන්ත මහත්තයා ලොකු ගෝරනාඩු දමන්නේ වැඩ කරන ජනතාවට මහින්දගේ ආණ්ඩුවෙන් වෙන අසාධාරණ ගැනයි. ඒත් එයාගේ නායකතුමා කියන්නේ දෙමළ කැරැල්ල මැඩපැවැත්වීම හරියට නොකරන නිසා තමන් රජයට විරුද්ධ බවයි.

ධනපති හමුදාව මගින් කැරලි මැඩ "ප්‍රජාතන්ත්‍රවාදය සහ සංස්කෘතිය" රැකීමට මහින්ද ක්‍රියා නොකිරීම ගැනයි ඔහුගේ නෝක්කාඩුව.

දන් ලාල් කාන්ත උන්නැහේ මේ උතුර බේරා ගැනීම වෙනුවෙන් කරන යාඥා නොතකා මහ වැඩවර්ජන කිරීමෙන් සිදුවෙන්නේ ධනපති රජය සහ ගැටුමට යාමයි. එවිට ධනපති හමුදාව ලාල්ගේ ඇටකටු කඩා හිර ගෙවල්වල දාන්න ඉඩ තියෙනව.

මෙතැනදී ජනතා විමුක්ති පෙරමුණ ගන්නේ කාගේ පැත්තද? වැඩවර්ජනයට බැට දෙන්න එන රාජ්‍ය හමුදාවේ පැත්තද, නැත්නම් බැට කන කම්කරුවන්ගේ පැත්තද?

සෝමේගේ උත්තර අනුව නම් නායකයෝ හමුදාවේ පැත්ත ගත යුතුයි. දේශප්‍රේමී හමුදාව සමඟ දේශද්‍රෝහී ලාල් කාන්තලාට බැට දිය යුතුයි.

මං හිතන්නේ විමල් වීරවංශ කෙලින්ම මේ කථාව කියනව. පංති සටන නෙවෙයි දේශප්‍රේමය වැදගත් කියල. ඒත් අද ඉතිරිවෙලා ඉන්න ජනතා විමුක්ති පෙරමුණේ නායකයන් ඊට සමාන අදහස් දක්වමින් අවුලක පැටලිලා බවයි අපට පෙනෙන්නේ.